# රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

## වාහන අලුත්වැඩියා හා නඩත්තු සේවා කිරිම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2026/2027

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් 2026/2027 වර්ෂය සඳහා පහත සඳහන් වාහන අලුත්වැඩියා කිරිම්, අමතර කොටස් මිල දී ගැනිම හා වාහන නඩත්තු සේවා කිරිම වෙනුවෙන් කීර්තිමත් හා විශ්වාසනීය සැපයුම්කරුවන්/ගරාජහිමියන් ලියාපදිංචිය සඳහා 2026.03.27 දින ප.ව.2.00 දක්වා මුද්‍රා තබන ලද අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සඳහා රු.2000.00ක ආපසු නොගෙවනු ලබන තැන්පත් මුදලක් අප දෙපාර්තමේන්තුවේ සරප් වෙත ගෙවා ලබා ගන්නා කුවිතාන්සිපත ප්‍රසම්පාදන අංශයට ඉදිරිපත් කිරිමෙන් පසුව අයදුම්පත් 2026.03.06 දින සිට 2026.03.26 දින දක්වා පෙ.ව 9.00 සිට ප.ව. 3.00 දක්වා කාර්යාල වේලාවන් තුලදී ලබාගත හැක.

සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම සඳහා වන අයදුම්පත බහා එවන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2026/2027"** ලෙස සටහන් කළ යුතුය. අයදුම්පත් 2026.03.27 වන දින ප.ව.2.00ට පෙර රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, නො: 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05 ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ ගෙනවිත් ප්‍රසම්පාදන අංශයට (ටෙන්ඩර් පෙට්ටියට) භාර දීමට ද හැකිය.

| **කාණ්ඩ අංක** | **භාණ්ඩ / සේවා** |
|---|---|
| **1** | **වාහන අලුත්වැඩියා** |
| 1.1 | වාහන අලුත්වැඩියාව (පෙට්‍රල්/ඩීසල්) |
| 1.2 | ටින්කරින් හා පේන්ට් කිරිම |
| 1.3 | වාහන විදුලි පද්ධතීන් අලුත්වැඩියා කිරීම |
| 1.4 | වාහන වායු සමීකරණ අලුත්වැඩියාව |
| 1.5 | වාහන සේවාව සහ අභ්‍යන්තර පිරිසිදු කිරීම |
| 1.6 | වාහන උඩු වියන්, කුෂන්, ආවරණ, බුමුතුරුණු ආදිය |
| **2** | **වාහන අමතර කොටස්** |
| 2.1 | මෝටර් රථ අමතර කොටස් |
| 2.2 | බැටරි හා ටයර් (වීල් එලයිමන්ට් හා වීල් බැලන්සින් සමඟ) |
| 2.3 | වාහන උපාංග |

එච්.එස්.කේ.ජේ. බණ්ඩාර
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

දුරකථන අංකය :- 011-2514759
ෆැක්ස් අංකය :- 011-2514286